Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

## තෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2019

## Third Term Test - Grade 8 - 2019

**නම :** ............................................... **බුද්ධ ධර්මය** **කාලය : පැය 02 යි.**

සැලකිය යුතුයි.

- පළමුවැනි කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට ලකුණු දෙක බැගින් ලකුණු 40ක් හිමිවේ.
- දෙවන කොටසේ පළමුවැනි ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

---

## I කොටස

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(1) අෂ්ට ගරුධර්ම පිළිගනිමින් කාන්තාවන්ට පැවිදිවීමට අවස්ථාව උදාකර දුන්නේ,

1. යශෝධරා දේවිය ය. 2. ප්‍රජාපතී ගෝතමී දේවිය ය.
3. මහාමායා දේවිය ය. 4. සුමනා දේවිය ය.

(2) සුදත්ත සිටුවරයා බුදුරජාණන්වහන්සේ හමුවූයේ කොහේදී ද?

1. කුසිනාරා නුවර දී 2. මේදතලුම්ව නම් නියම්ගමේ දී
3. රජගහනුර සීත වනයේ දී 4. චම්පා නුවර දී

(3) බුදුරජාණන් වහන්සේගේ ධර්මය ඕනෑම කෙනෙකුට විමසා බැලීමේ දී හැකියාව තිබෙන නිසා,

1. ඒහි පස්සික යනුවෙන් හැඳින්වේ. 2. ඕපනයික යනුවෙන් හැඳින්වේ.
3. සන්දිට්ඨික යනුවෙන් හැඳින්වේ. 4. ස්වාක්ඛාත යනුවෙන් හැඳින්වේ.

(4) නිවසක කෙනෙකු මියගිය විට එම නිවෙස්වල සිදුකළ පැරණි චාරිත්‍රයක් වන්නේ කුමක් ද?

1. විනෝද ක්‍රීඩා නොකිරීම. 2. පැමිණෙන සියලුදෙනා සුදු ඇඳුමෙන් සැරසී පැමිණීම.
3. මතක වස්ත්‍රයක් පූජා කිරීම. 4. රාත්‍රී කාලයේ සතිපට්ඨාන සූත්‍රය කියවීම.

(5) සම්මා සම්බුදුරජාණන් වහන්සේ උතුම් වූ චතුරාර්ය සත්‍යය ගුරු උපදේශ නැතිව තමාගේ ම නුවණින් අවබෝධ කරගත් නිසා,

1. සම්මා සම්බුද්ධ නම් වන සේක. 2. සුගත නම් වන සේක.
3. ලෝකවිදූ නම් වන සේක. 4. අරහං නම් වන සේක.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

ⅰ අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන තුළින් තෝරා හිස්තැන මත ලියන්න.
**(දුක්ඛ දුක්ඛතා, කාලසිලා, මියුළු, මහා සාවද්‍ය, ආයුක්ඛය)**

(6) මුගලන් මහරහතන් වහන්සේ .................................. ප්‍රදේශයට වැඩමවා පිරිනිවන් පා වදාළ සේක.

(7) මත්පැන් හා මත් ද්‍රව්‍ය පාවිච්චි කිරීම ...................................................... අකුසලයකි.

(8) වෛදේහ රජතුමා ...................................... නුවර රජකම් කළේ ය.

(9) සත්වයාගේ ආයුෂ ගෙවීයාම නිසා මරණයට පත්වීම ............................................. මරණ නම් වේ.

(10) ජාතිය ජරාව ආදී සියලු කායික හා මානසික දුක් සමූහය ............................................... යනුවෙන් හැඳින්වේ.

ⅰ පහත A තීරුවේ දැක්වෙන ප්‍රකාශයට ගැළපෙන පිළිතුර B තීරුවෙන් තෝරා පිළිතුරට අදාළ අංකය ඉදිරියේ ඇති වරහනෙහි යොදන්න.

| | | | |
|---|---|---|---|
| (11) | බුදුරජාණන් වහන්සේ මංගල ධර්ම දේශනය පැවැත්වීම. | (.........) | 1. සැරියුත් තෙරුන්ගේ ශිෂ්‍ය පිරිස |
| (12) | බුදුරජාණන් වහන්සේ මහා සීහනාද සූත්‍රය දේශනා කිරීම. | (.........) | 2. ආනන්ද තෙරුන් ප්‍රධාන ශිෂ්‍ය පිරිස |
| (13) | දීඝනිකාය කට පාඩමින් ආරක්ෂා කිරීම. | (.........) | 3. රජගහනුවර සප්තපර්ණි ගුහාව ඉදිරිපිට |
| (14) | මජ්ඣිම නිකාය කටපාඩමින් ආරක්ෂා කිරීම. | (.........) | 4. විශාලා නුවර අසල වන පියසක දී |
| (15) | ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්වීම. | (.........) | 5. බරණැස ඉසිපතන මිගදාය |

ⅰ පහත දැක්වෙන ප්‍රකාශ හරි නම් ( ✔ ) ලකුණ ද වැරදි නම් ( ✕ ) ලකුණ ද ඉදිරියේ තිබෙන වරහනෙහි යොදන්න.

(16) බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී දේහය ආදාහනය කළ චිතකයෙහි ධාතූන් වහන්සේලා සත් නමක් බිඳී විසිරී නොගොස් ඉතිරිව පැවතිණි. (.............)

(17) කර්මය පිළිබඳ ඉගැන්වීම ප්‍රධාන බෞද්ධ ඉගැන්වීම්වලින් එකකි. (.............)

(18) ප්‍රථම ධර්ම සංගායනාවට හේතුවූයේ මහා කාශ්‍යප තෙරුන්ගේ නොමනා ප්‍රකාශයයි. (.............)

(19) ශ්‍රී දළදා වහන්සේ උදෙසා වප් පොහෝදා රාත්‍රියේ කාර්තික මංගල්‍යය පැවැත්වේ. (.............)

(20) මහාමංගල්‍ය සූත්‍රය දේශනා කළේ ජේතවනාරාම විහාරයේ දී ය. (.............)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## II කොටස

 l පළමුවැනි ප්‍රශ්නය ඇතුලු ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(01) පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) බුදුරජාණන් වහන්සේගේ චරිතයෙන් පිළිබිඹුවන ආචාරශීලී ගුණාංග දෙකක් ලියන්න.

(ii) ඇම පමණින් පැවසූ මුණි දූන තතු - මෙම හැමදෙන බලවයි දැක්විය යුතු යන කවියෙහි ඉතිරි පද දෙක ලියන්න.

(iii) අෂ්ටාංග සීලයේ හත්වැනි සිල්පදය ලියන්න.

(iv) අට වැදෑරුම් දුක්වලින් දෙකක් නම් කරන්න.

(v) සිතින් සිදුවන කුසල කර්ම දෙකක් ලියන්න.

(vi) ''චේතනාහං භික්ඛවේ කම්මං වදාමි'' යන පාඨයේ අර්ථය ලියන්න.

(vii) දිවා රෑ පින් වැඩෙන පින්කම්වලින් දෙකක් නම් කරන්න.

(viii) ප්‍රථම ධර්ම සංගායනාවේ දී විනය පිටකය බෙදුණු කොටස් වලින් දෙකක් නම් කරන්න.

(ix) ශ්‍රී දළදා වහන්සේ පිළිබඳ ලියැවුණු ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

(x) අණන සූත්‍රයේ සඳහන් ගිහියන් විසින් උපදවාගනු ලැබිය යුතු සැප හතර නම් කරන්න. (2 x 10 = 20)

(02) (i) බුදුරජාණන් වහන්සේගේ ගුණ සිහිකරමින් කරන භාවනාව කුමක් ද? (ලකුණු 02)

(ii) බුදුගුණ භාවනාවෙන් ලැබෙන ආනිශංස තුනක් නම් කරන්න. (ලකුණු 03)

(iii) භාවනාවට හුරුවීම ඉගෙනීමේ කටයුතු සාර්ථක කරගැනීමට හේතුවන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(03) (i) තණ්හාව බෙදෙන ආකාර තුනෙන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ඒවායින් එකක් කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 03)

(iii) තණ්හාව දුකට හේතුවන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(04) (i) ''ඒකං ධම්මං අතීතස්ස - මුසාවාදිස්ස ජන්තුනෝ'' යන ගාථාවේ ඉතිරි පද දෙක ලියන්න. (ලකුණු 02)

(ii) එම ගාථාවේ අර්ථය ලියන්න. (ලකුණු 03)

(iii) බොරුකීම නිසා සිදුවියහැකි හානි පිළිබඳ පැහැදිලි කරන්න. (ලකුණු 05)

(05) (i) බුදුරජාණන් වහන්සේ දේශනා කළ නොකළ යුතු වෙළඳාම්වලින් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) බුදු දහමේ උගන්වන ධාර්මික රැකියා තුනක් නම් කරන්න. (ලකුණු 03)

(iii) රැකියාවක් තෝරා ගැනීමේ දී ඔබ සැලකිලිමත් විය යුතු කරුණු මොනවාදැයි ලියා දක්වන්න. (ලකුණු 05)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(06) (i) මංගල සූත්‍රයේ සඳහන් මංගල කරුණුවලින් දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) සප්ත අපරිහානීය ධර්මවලින් තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) සප්ත අපරිහානීයධර්ම අනුගමනය කිරීමෙන් යහපත් රාජ්‍ය පාලනයක් ඇතිවන බව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(07) පහත සඳහන් මාතෘකාවලින් දෙකක් තෝරාගෙන කෙටිසටහන් ලියන්න.

(i) සිංහල බෞද්ධ සිරිත්

(ii) මුගලන් මහරහතන් වහන්සේ

(iii) දළදා පූජා

(iv) බුදු ගුණ භාවනාව

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

තෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2019
# Third Term Test - Grade 8 - 2019

බුද්ධ ධර්මය - පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 06. | කාලසිලා | 11. | 5 | 16. | ✔ |
| 02. | 3 | 07. | මහා සාවද්‍යය | 12. | 4 | 17. | ✔ |
| 03. | 1 | 08. | මියුළු | 13. | 2 | 18. | ✕ |
| 04. | 4 | 09. | ආයුක්ඛය | 14. | 1 | 19. | ✕ |
| 05. | 1 | 10. | දුක්ඛ දුක්ඛතා | 15. | 3 | 20. | ✔ |

(එක් පිළිතුරකට ලකුණු 2 බැගින් ලකුණු 40)

## II කොටස

01. (i)
- සුහදශීලී කතාබහ
- ආගන්තුක සත්කාරය
- මහජන මතයට ගරු කිරීම
- අල්ප ශබ්දතාවය
- නිහතමානී බව (ලකුණු 02)

(ii) තම තම නැණ පමණින් දැනගත යුතු
මම නමදිමි සදහම් පහදා සිතු (ලකුණු 02)

(iii) නච්ච ගීත වාදිත විසූක දස්සන මාලා ගන්ධ
විලේපන ධාරණ
මණ්ඩන විභූසනට්ඨානා වේරමණී
සික්ඛාපදං සමාදියාමි (ලකුණු 02)

(iv)
- ජාතිය හෙවත් ඉපදීම
- ජරාව හෙවත් වයස්ගත වීම
- ව්‍යාධිය හෙවත් රෝග පීඩාවලට ලක්වීම.
- මරණය හෙවත් ජීවිතයේ අවසානය
- අප්‍රියයන් හා එක්වීම.
- ප්‍රියයන්ගෙන් වෙන්වීම
- කැමති දේ නොලැබීම.
- උපාදාන ස්කන්ධ පහම දුකකි.

(ලකුණු 02)

(v) 1. දැඩි ලෝභයෙන් වැළකී පරිත්‍යාගශීලී වීම.
2. ද්වේශයෙන් වැළකී මෛත්‍රියෙන් යුක්ත වීම.
3. වැරදි දෘෂ්ටිවලින් වැළකී නිවැරදි දෘෂ්ටිය ඇති කර ගැනීම. (ලකුණු 02)

(vi) මහණෙනි, මම චේතනාව කර්මයයැයි කියමි.
(ලකුණු 02)

(vii) 1. මල් පල උයන් වතු වැවීම.
2. පියෙවි වන වගා කිරීම.
3. ඒ දඬු පාලම් තැනීම.
4. පැන්හල් තැනීම, පොකුණු තැනීම.
5. ආවාස තැනීම.
(ලකුණු 02)

(viii) 1. පාරාජිකා පාලි
2. පාචිත්තිය පාලි
3. චුල්ලවග්ග පාලි
4. මහාවග්ග පාලි
5. පරිවාර පාලි (ලකුණු 02)

(ix) 1. දළදා සිරිත
2. දළදා පූජාවලිය
3. දළදා වරුණ (ලකුණු 02)

(x) 1. අත්ථි සුඛ
2. භෝග සුඛ
3. අනණ සුඛ
4. අනවජ්ජ සුඛ

(එක් සුඛයකට 1/2 බැගින් ලකුණු ලබා දෙන්න.)

(02)(i) බුදු ගුණ භාවනාව/ බුද්ධානුස්සති භාවනාව
(ලකුණු 02)

(ii)
- බුදුරජාණන් වහන්සේ පිළිබඳ අසීමිත පැහැදීමක් ඇති වීම.
- පාපයට ලැජ්ජාව හා බිය ඇති වීම.
- සිත තුළ පවතින දරදඬු ගති යටපත් වීම.
- රාග දෝස මෝහ සිතුවිලි යටපත් වීම.
- බුදුගුණ ඇසුරෙන් සිත සෘජුභාවයට පත් වීම.
- නිරාමිස සතුටකින් සිත පිරීයාම
- කායික හා මානසික සංවරය ඇති වීම.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

● නපුරු අධර්මිෂ්ඨ සිතුවිලි ඇති නොවීම.
සිසුවා පෙළපොතේ 34වැනි පිටුවේ සඳහන් ආනිශංසවලින් තුනක් ලියාතිබිය යුතුය.
(ලකුණු 03)

(iii) සිසුවාගේ පිළිතුර සලකාබලා ලකුණු ලබාදෙන්න. භාවනාවෙන් සිත සංවරවීම හා ඒ තුළින් ඉගෙනීමේ කටයුතු සාර්ථක කරගන්නා ආකාරය පැහැදිලි විය යුතුය. (ලකුණු 05)

(03)(i) කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා
(ලකුණු 02)

(ii) **කාම තණ්හා**
පස්කම් සැපතෙහි ඇල්ම හෙවත් පසිඳුරන් පිනවීමේ ආශාව කාම තණ්හාවයි. බුදු දහමට අනුව ඉන්ද්‍රියන් හයකි. ඒවා පිනවීමට පුහුදුන් මිනිසුන් කැමති වෙති. පංචකාම සේවනය යනු එයයි. මෙසේ ඉඳුරන් පිනවීමට නැවත නැවත ඇතිවන කැමැත්ත කාම තණ්හාවයි.

**භව තණ්හා**
භව යනු වීමයි. පැවැත්ම ඇති බව, සිදුවීම යන අර්ථ එහි ඇත. ඒ අනුව පැවැත්මට ඇති ආශාව භව තණ්හාවයි. නිත්‍ය වූ ස්ථිර වූ ආත්මයක් ඇත යන විශ්වාසය නිසා භව තණ්හාව උපදී. නිත්‍ය වූ ස්ථිර වූ ආත්මයක් ඇත යන විශ්වාසය නිසා භව තණ්හාව උපදී. නිත්‍ය වූ භවයෙහි නැවත උපදිමින් පස්කම් සැප විඳීමේ ආශාව භව තණ්හාවයි.

**විභව තණ්හා**
ඇතැම්හු සත්වයාගේ නැවත ඉපදීමක් නැතැයි ද මරණයෙන් ජීවිතය කෙළවර වේ යැයි ද සිතති. ඒ අනුව ඔවුහු මෙලොව පැවැත්ම පමණක් පිළිගනිති. මෙලොව හැකිතාක් පස්කම් සුව විඳීමට කැමති වෙති. හය විභව තණ්හාවයි.

(මෙම තුනෙන් එක් විස්තරයක් සුදුසු පරිදි ලියා තිබේ නම් ලකුණු තුනක් ලබා දෙන්න.)

(iii) කාම, භව, විභව යන තුන් ආකාරයේ තණ්හාව ම දුකට හේතු වේ. මිනිසුන් අතර පවතින අසමගි, අමනාපකම්, කල කෝලාහල ඝාතන යුධ අපරාධ ආදියට මූලික හේතුව තණ්හාවයි. පුද්ගලයාගේ මෙලොව ජීවිතය ක්‍රමයෙන් පරිහානියට යොමු කරන්නේ තණ්හාවයි. තණ්හාවේ දාසයෙකු වීමෙන් පුද්ගලයෝ විනාශයට පත්වෙති. යනා දී වශයෙන් තණ්හාව දුකට හේතුවන ආකාරය පැහැදිලි කර තිබෙන අයුරු සලකාබලා ලකුණු ලබා දෙන්න.

(04)(i) ඒකං ධම්මං අතීතස්ස - මුසාවාදිස්ස ජන්තුනෝ
විතින්න පරලෝකස්ස - නත්ථි පාපං අකාරියං

(ii) ඇත්ත කීම නම් වූ එක ම දහම ඉක්ම වූ බොරු කියන සුළු වූ පරලොව ගැන බලාපොරොත්තු නැත්තා වූ පුද්ගලයාට කළ නොහැකි පාපයක් නැත්තේ ය. (ලකුණු 03)

(iii) සිදු වූවක් සිදු නොවූවක් ලෙස කීම ද සිදු නොවූවක් සිදු වූවක් ලෙස කීම ද බොරු කීම නම් වේ. සමාජ සංස්ථා දෙදරා යෑමට හොඳ හිත පලුදු වීමට, සමගිය සමාදානය බිඳ වැටීමට බොරුව ඉවහල් වෙයි. සාමාන්‍ය ජනයා අතර බොරුකීමේ පුරුද්ද ඇත්තෝ බොහෝ ය. බොරු කියන්නාට නොකළ හැකි පාපයක් නැත. බොරු කියන්නා සියල්ලන්ට ම අප්‍රිය වේ. ආදී වශයෙන් සිසුවා ලියා ඇති පිළිතුර සලකා ලකුණු ලබා දෙන්න.
(ලකුණු 05)

(05)(i) අවි ආයුධ වෙළඳාම
සත්ත්ව වෙළඳාම
මස් වෙළඳාම
මත් ද්‍රව්‍ය වෙළඳාම
වස වෙළෙඳාම (කරුණු දෙකකට ලකුණු 2යි)

(ii) කෘෂි කාර්මාන්තය
ධාර්මික වෙළෙඳාම
ගව පාලනය
රාජ්‍ය සේවය
අනෙකුත් ශිල්ප කර්මාන්ත
(කරුණු තුනක් සඳහා ලකුණු 3යි)

(iii) අධාර්මික රැකියාවන්ගෙන් මෙන්ම ධාර්මික රැකියා තෝරාගන්නා ආකාරය පිළිබඳ ඇතුළත් පිළිතුරක් සඳහා සම්පූර්ණ ලකුණු ලබාදෙන්න.
(ලකුණු 5යි.)

(06)(i) පෙළපොතේ 148, 149 පිටුවල සඳහන් මංගල කරුණු වලින් දෙකක් ලියා තිබේ නම් ලකුණු 2යි.

(ii) ● නිතර රැස්වීම
● සමගිව රැස්ව, සමගිව සාකච්ඡා කර සමගිව විසිර යෑම.
● නොපැනවූ නීති නොපැනවීම හා පැන වූ නීති කඩ නොකර ආරක්ෂා කිරීම. පෙළ පොත 142, 143, 144, 145 පිටු බලන්න.
(කරුණු තුනක් සඳහා ලකුණු 3යි)

අපරිහානීය ධර්ම කරුණුවලින් අඩක් ලියා තිබේ නම් අඩක් ලකුණු දෙන්න.

(iii) සිසුවාගේ පිළිතුර සමස්ථයක් ලෙස සලකා ලකුණු ලබා දෙන්න. (ලකුණු 5යි.)

(07)(i) පෙළපොත 4 පාඩමට අනුව ලියා තිබිය යුතුය.

(ii) පෙළපොතේ 45, 46 පිටු බලන්න.

(iii) 19 වැනි පාඩමේ සඳහන් දළඳා පූජා පිළිබඳ කෙටි හැඳින්වීමක් තිබිය යුතුය.

(iv) 32 පාඩම අනුව බුදුගුණ භාවනාව හඳුන්වා භාවනාව වඩන ආකාරය ද ඉන් ලැබෙන ප්‍රයෝජන ද දක්වා තිබිය යුතුයි.

(මාතෘකා දෙකක් විස්තර කිරීමට ලකුණු 5 x 2 = 10 ක් වේ)